(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

**අංක 25.]**

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2025 පෙබරවාරි 22 සෙනසුරාදා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

423/2025

ගරු ටී.කේ. ජයසුන්දර මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය බිඳ වැටෙමින් පවතින බව පිළිගන්නේද;

(ii) තේ නැවත වගාව සඳහා ක්‍රියාත්මක වූ ‘ස්ටාර්’ ව්‍යාපෘතියට මුදල් සැපයූ ආයතනය කවරේද;

(iii) සැපයූ මුළු මුදල කොපමණද;

(iv) එය ණයක්ද, නොඑසේ නම්, ප්‍රදානයක්ද;

(v) ණයක් නම්, වාර්ෂික පොලී අනුපාතය කොපමණද;

(vi) එම ණය ගෙවා අවසන් වන වර්ෂය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතියේ පරිපාලන ව්‍යුහය හා ඊට සම්බන්ධ පුද්ගලයන් කවරේද;

(ii) එමගින් තේ නැවත වගාව සිදු කර ඇති ඉඩම් ප්‍රමාණය එක් එක් තේ පරීක්ෂක කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ව්‍යාපෘතිය යටතේ තේ නැවත වගා කරන ඉඩම් අක්කරයකට ගෙවූ මුදල හා පරිපාලන වියදම්වලට වෙන් කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මේ වනවිට එම ව්‍යාපෘතිය අවසන් කර තිබේ නම්, එම දිනය කවරේද;

(ii) වගාකරුවන්ට හිඟ මුදල් ගෙවිය යුතුව තිබේ නම්, එය එක් එක් තේ පරීක්ෂක කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ව්‍යාපෘතියේ විගණන වාර්තාව ඉදිරිපත් කරන්නේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

431/2025

ගරු ධනුෂ්ක රංගනාත් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළුතර දිස්ත්‍රික්කයේ, අයි-රෝඩ් ව්‍යාපෘතිය යටතේ KL-2 ව්‍යාපෘතිය (කළුතර පැකේජ් 2) නමින් ව්‍යාපෘතියක් තිබූ බවත්;

(ii) අදාළ කොන්ත්‍රාත් සමාගම නීතිමය ක්‍රියාමාර්ගයකට අවතීර්ණ වීම හේතුවෙන් ඉහත ව්‍යාපෘතිය අතරමග නවතා ඇති බවත්;

(iii) ඒ හේතුවෙන් ප්‍රදේශයේ ජනතාව දැඩි පීඩාවකට පත් වී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතිය යටතේ අගලවත්ත සහ මතුගම මැතිවරණ බලප්‍රදේශ තුළ සංවර්ධනය කිරීමට නියමිතව තිබූ මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම ව්‍යාපෘතියට අදාළ කොන්ත්‍රාත් සමාගම/සමාගම් කවරේද;

(iii) එම සමාගමේ/සමාගම්වල හිමිකාරිත්වය කවරේද;

(iv) ඉහත නීතිමය ක්‍රියාමාර්ගයේ වර්තමාන තත්ත්වය කවරේද;

(v) ඉහත ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

433/2025

ගරු දිනිඳු සමන් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුල්ල, මීගහකිවුල නව නගරය ඉදිකිරීමට සමගාමීව මීගහකිවුල බස් නැවතුම්පළ ඉදිකිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(ii) මේ දක්වා එම බස් නැවතුම්පළ භාවිතයට ගෙන නොමැති බව දන්නේද;

(iii) එසේ නම්, ඊට හේතු කවරේද;

(iv) ඉහත බස් නැවතුම්පළ ජනතාවගේ භාවිතය සඳහා ලබාදීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(v) එම බස් නැවතුම්පළ සඳහා ප්‍රවේශ මාර්ගය ඉදිකිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත බස් නැවතුම්පළ ප්‍රයෝජනවත් නොවන ඉදිකිරීමක් බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඊට වගකිවයුතු පුද්ගලයන්ට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඉදිරියේදී මෙවැනි තත්ත්වයක් ඇති නොවීම පිණිස පළාත් පාලන ආයතනවලට කරනු ලබන මගපෙන්වීම් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

438/2025

ගරු නිශාන්ත පෙරේරා මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(ii) එම ප්‍රමාණය එක් එක් ග්‍රාම නිලධාරි වසම අනුව අක්කරවලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම් අතරින් දෙවන පාර්ශ්ව වෙත ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(iv) එම ඉඩම් ලබා දී ඇති දෙවන පාර්ශ්වයේ නම, එම එක් එක් පාර්ශ්වයට ඉඩම් ලබාදී ඇති ග්‍රාම නිලධාරි වසම සහ ඉඩම් ලබා දී ඇති පදනම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

**යෝජනා පිළිබඳ දැනුම්දීම**

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— වරප්‍රසාද,— පාර්ලිමේන්තු මන්ත්‍රිනී ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය විසින් තමාගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2025 පෙබරවාරි 20 දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය.

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*1.

විසර්ජන පනත් කෙටුම්පත — (පස්වැනි වෙන් කළ දිනය) — විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2025 පෙබරවාරි 17) [1].

*2.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— මුදල් පනත යටතේ නියෝගය,— 2012 අංක 12 දරන මුදල් පනතේ විධිවිධාන සමඟ කියවිය යුතු 2013 අංක 12 දරන මුදල් පනතේ 12 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 නොවැම්බර් 22 දිනැති අංක 2411/56 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.02.14 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**[1]**

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.